# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1675/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 05 /11/2024
පැය 0900

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - ත්‍රිකුණාමලය පොලිස් වසම.

2024.11.05 වන අද දින අළුයම් කාලයේදී ත්‍රිකුණාමලය පොලිස් වසමේ ත්‍රිකුණාමලය නගරයේ පිහිටා ඇති පුද්ගලික රෝහලක් තුල කාන්තාවක් තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට ත්‍රිකුණාමලය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 63 ක් වූ එම රෝහලේම තෙවන මහලේ නේවාසික පදිංචිකාරියකි.**

මරණකාරිය විදෙස් ගතව සිට වෛද්‍යවරයෙකු වන තම ස්වාමි පුරුෂයාට අයත් එම රෝහලේම 03 වන මහලේ පිහිටි නේවාසික කාමරයට පැමිණෙමින් සිටියදී මරණකාරියගේ සැමියාගේ සහෝදරයා විසින් මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. ඝාතනය සිදු කිරීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර වයස අවුරුදු 55 ක් වන ඝාතනයට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහුද එම මහලේම කාමරයක නේවාසිකව පදිංචිව සිටින බවට අනාවරණය වී ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර, ත්‍රිකුණාමලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - නුංගමුව පොලිස් වසම.

2024.11.04 වන දින රාත්‍රී කාලයේ නුංගමුව පොලිස් වසමේ බේකරි හන්දිය ප්‍රදේශයේදී වේයන්ගොඩ දෙස සිට මාලිගාතැන්න දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය අයිනේ ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පදික පුද්ගලයා බරපතල තුවාල ලබා වතුපිටිවල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පදික පුද්ගලයා මියගොස් ඇත. යතුරුපැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ මාලිගාතැන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නුංගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**